## කොවිඩ් - 19 සති පාසල - සබරගමුව

( නිවිතිගල අධ්‍යාපන කලාපය)

විෂය :- නාට්‍ය හා රංගකලාව ශ්‍රේණිය :- 09 සතිය :- 1

පාඩම :- පරිකල්පන අභ්‍යාසවල යෙදෙමු

**ක්‍රියාකාරකම්**

- ඔබ කැමති සංගීත ඛණ්ඩ කිහිපයක් තෝරාගෙන එකින් එක හොඳින් දෑස් පියාගෙන ශ්‍රවණය කරන්න.
- එම සංගීත ඛණ්ඩ ශ්‍රවණයේදී ඔබට දැනුණු හැඟීම සටහන් කරගන්න.
- එම සංගීත ඛණ්ඩ අතුරින් එක් සංගීත ඛණ්ඩයක් තෝරාගෙන එයට අදාළව අභිරූපන රංගනයක් නිර්මාණය කරන්න.

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

1. පරිකල්පනය යනු කුමක් ද?
2. පරිකල්පන අභ්‍යාස වල යෙදීමේ වැදගත්කම විස්තර කරන්න.
3. ඔබ 8 ශ්‍රේණියේ දී පරිකල්පනය යොදා ගනිමින් සිදුකළ නාට්‍යමය අවස්ථාවක් ලියා දක්වන්න.

# තොරතුරු පත්‍රිකාව

- පරිකල්පනය යනු සිතින් මවා ගැනීමේ ශක්තියයි නැතහොත් යමක් පිළිබඳව නවමු ආකාරයකට සිතීමයි.
- පෙනෙන හෝ අත්සන හෝ දකින දේට වඩා වෙනස් අලුතින් යමක් සිතීම පරිකල්පනය ලෙස තවදුරටත් හැඳින්විය හැකිය
- උදාහරණයක් ලෙස පන්ති කාමරයේ තිබෙන ඉදල කොස්ස පොත් පොත් පත් අතට ගෙන එය වෙනත් උපකරණයක් ලෙස සිතිය හැකි ය
- නාට්‍ය නිර්මාණයේ දී පරිකල්පන ශක්තිය ඉතා වැදගත් සාධකයක් ලෙස පෙන්වා දිය හැකි ය
- පරිකල්පනය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. එනම් එය පුද්ගල බද්ධ කාර්යයකි කාර්යකි. ඒ අනුව එකම දෙයක් පිළිබඳව එක් එක් පුද්ගලයාට වෙනස් ආකාරයට සිතිය හැකිය.
- සාමූහිකව එක් වූ විට සියලුම දෙනාගේ පරිකල්පන ශක්තියෙන් වල එකතුවෙන් ඉතා විශිෂ්ට ගණයේ නිර්මාණ බිහි කළ හැකිය
- පිටපත් රචනා කරන රචකයාට ද රඟපාන නළු නිළියන්ට ද අධ්‍යක්ෂකවරයාට මෙන් ම ආනුෂංගික ශිල්පීන්ට ද අපූර්ව පරිකල්පන හැකියාවක් තිබිය යුතුය. එවිට ඉතා විශිෂ්ඨ ගණයේ නාට්‍ය බිහි කිරීමේ හැකියාව පවතී.

කේ.එම්.චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත ම.ම.වි.
නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය.